# විශේෂ මහා සභාව
# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව
**දිනය** : 2012.10.10
**වේලාව** : ප.ව. 9.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයඃ**

1. ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු උප සභාපති ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මනත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා
5. ගරු නාගරික මනත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීමඃ

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුම සභාව අමතමින් මෙම විශේෂ සභා වාරය පවත්වන්නට යෙදෙන්නේ තමන් සහ මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා හට ඉන්දුනීසියාවේ යොයකර්තා නගරයේ පැවැත්වීමට නියමිත ආපදා කළමනාකරණය පිළිබඳ අමාත්‍ය සමුළුවට සහභාගි වීම සඳහා අදාල අනුමැතිය ලබා ගැනීමටත්, ධීවර සංස්ථාවේ මාළු වෙළඳසැලක් අනවසරයෙන් බළන්ගොඩ නගරයේ විවෘත කිරීමට නියමිත බැවින් ඒ සම්බන්ධව තීරණයක් ගැනීමට සහ ඊයේ (2012.10.09) වන දින අතිගරු ජනාධිපතිතුමන් පළාත් පාලන ආයතන ප්‍රධානීන් ඇමතු රැස්වීම පිළිබඳව සභාව දැනුවත් කිරීමටත් බව ප්‍රකාශ කළ අතර, මෙම විශේෂ සභා වාරයට පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බව ප්‍රකාශ කරන ලදී.

## 03. සභාවට ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම

### 03:01 ආපදා කළමනාකරණය පිළිබඳ අමාත්‍ය සමුළුව - ඉන්දුනීසියාව

2012.09.27 වන දින අංක 06:22 යටතේ සභාගත කරන ලද ලිපිය අනුව 2012 ඔක්තෝබර් මස 22 වන දින සිට 25 වන දින දක්වා ඉන්දුනීසියාවේ යොග්‍යකර්තා නගරයේ දී පැවැත්වීමට නියමිත එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආපදා අවම කිරීම පිළිබඳ අමාත්‍ය සමුළුව සඳහා බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා සහ

මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතාට සහභාගී වන ලෙස කර තිබූ ආරාධනය අනුමැතිය සඳහා 2012.10.10 විශේෂ මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, අදාල සමුළුව සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා සහභාගී කරවීම සහ නිවාඩු අනුමත කිරිම සඳහා ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් සිදු කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙය විශේෂ මහා සභාව විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආපදා අවම කිරිමේ ව්‍යාපෘතිය යටතේ බළන්ගොඩ නගර සභාවේ ක්‍රියාත්මක සිව් අවුරුදු සැලැස්ම සඳහ අදාල අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබා ගැනීමට මෙම ජාත්‍යන්තර සමුළුව පැවැත්වෙන බවත්, මේ සඳහා ගරු සභාපතිතුමා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සහභාගී වීම සඳහා අවශ්‍ය ගුවන් ටිකට්පත් සහ නවාතැන් පහසුකම් ඇතුළු වියදම් එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් දරන බව ද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපියේ දක්වා ඇත.

**03:02 ලංකා ධීවර සංස්ථාවේ මාළු වෙළඳසැලක් විවෘත කිරීම**

2012.10.14 වන දින ධීවර සංස්ථාවට අයත් මාළු වෙළඳසැලක් බළන්ගොඩ නගරයේ විවෘත කිරීමට නියමිත බව දන්වමින් සිදු කරන ලද ආරාධනා ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම මාළු වෙළඳසැල විවෘත කිරීමට සූදානම් වන්නේ එවන් කාර්යයක දී නගර සභාවෙන් ලබා ගත යුතු අනුමැතිය නොමැතිව බැවින් සහ නගරයේ පොදු වෙළඳසැලෙන් පිට මසුන් අලෙවි නොකරන අතර එම සීමාවෙන් පිට ඉදිකර ඇති බැවින් එම වෙළඳසැල විවෘත කිරීමට එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ගයන් ගැනීමටත් තීරණය කරන ලදී.

## 04. යෝජනා

04:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික්ෂා මැතිතුමා සභාව අමතමින්, පොල සහ පොදුවෙළඳසැල ඉදිරිපිට ත්‍රීරෝද රථ ගාල් කිරීම නවත්වන ලෙසත්, පාරිභෝගිකයන්ගේ වාහන නතර කිරීම සඳහා පමණක් ඉඩ ලබා දෙන ලෙසත් යෝජනා කරන ලදී.

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් එය ස්ථිර කරන ලද අතර සභාවේ අනුමැතිය හිමිවිය

## 05. වෙනත් කරුණු

**04:01 ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා සභාව අමතමින්, ඉදිරියේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත පළාත් පාලන මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ යෝජනාව සම්බන්ධව පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ විශේෂ රැස්වීමක් ඊයේ (2012.10.09 වන දින) අරලියගහ මන්දිරයේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති බව සඳහන් කළේය. වර්තමානයේ පවතින සමානුපාතික ඡන්ද ක්‍රමය හේතුවෙන් එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර ද නොයෙකුත් ආකාරයේ ගැටුම් නිර්මාණය වන බවත්, එවන් ගැටලුකාරී තත්වයන් බළන්ගොඩ නගරයේ ද පැවති බවත්, මෙවන් අගතිගාමී තත්වයන් දුරුකිරීම සඳහා පළාත් පාලන මැතිවරණ කොට්ඨාස ක්‍රමයට පැවැත්වීම ඉතා උචිත බවත් සඳහන් කළේය.

ගරු සභාපතිතුමා තව දුරටත් සභාව අමතමින්, බළන්ගොඩ නගර සභාව මේ වන විට ජාත්‍යන්තරයේ ද පිළිගැනීමක් ඇති පළාත් පාලන ආයතනයක් බවට පත්ව ඇති බව සඳහන් කළේය. ලෝකයේ හොඳම පළාත් පාලන ආයතන සඳහා පිරිනමනු ලබන Guangzhou සම්මානය සඳහා ද මෙම සභාව ලෝකයේ පළාත් පාලන ආයතන 150ක් අතරින් මුල් ස්ථාන කිහිපය අතරට එක්විමට නිර්දේශ වීම එයට උදාහරණයක් බව ද, UN-Habitat ආයතනය මගින් ඔස්ට්‍රේලියානු රජයේ මූල්‍යමය ආධාර මත බළන්ගොඩ නගරයේ ආපදාවන් සඳහා සූදානම් වීම පිණිස දොරවෙල ඔය සංරක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබීමෙන් මෙම නගරයේ සංවර්ධනය සඳහා ජාත්‍යන්තරයේ දායකත්වය ලැබෙන ආකාරය පැහැදිලි වන බව ද ප්‍රකාශ කළේය.

එමෙන්ම නිත්‍යානුකූල නොවන පරිදි වෙළඳසැල් ඉදිකිරීම නොකළ හැකි බැවින්, එක් අයකුගෙන් රු. 20,000.00ක් අයකර පවරා දිය නොහැකි වන පරිදි කඩ ඉදිකර දීමටත්, එම මුදල් ගැමුණු වෙළඳ සංගමයේ සභාපතිවරයාවරයා වෙත එකතු කර කොන්ත්‍රාත්කරු වෙත ලබා දීමට කටයුතු කළ හැකි බව ද දන්වන ලදී.

**04:02 ගරු උප සභාපති වසන්ත ගුණරත්න මැතිතුමා**

සියලු දෙනා වෙත සාධාරණය ඉටුවන මැතිවරණ ක්‍රමයක් සඳහා තමන්ගේ ද කැමැත්තක් ඇති අතර, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් හඳුන්වා දීමට නියමිත කොට්ඨාස මැතිවරණ ක්‍රමය ඒ සඳහා යහපත් පෙළඹවීමක් ද බව සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ එකම පක්ෂයේ නියෝජිතයන් අතර ගැටුම් ඇති වූ අවස්ථා කිහිපයක් උදාහරණයට ගනිමින් පැහැදිලි කරන ලදී.

## 05 අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

අද දින විශේෂ සභා වාරයේ වැඩකටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පල කරමින් මහා සභාවේ කටයුතු පෙ.ව. 10.00ට අවසන් කරන ලදී.